"விளைத்திறன் மிக்க மனிதவள முகாமைத்துவ முன்னோடி"
"Leader in effective Human Resource Management"

උව පළාත් සභාව
ஊவா மாகாண சபை
Uva Provincial Council

# නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය

பிரதி பிரதான செயலாளர் (ஆளணி மற்றும் பயிற்சி) காரியாலயம்
OFFICE OF THE DEPUTY CHIEF SECRETARY (PERSONNEL & TRAINING)

රජ වීදිය, බදුල්ල | இராஜ வீதி, பதுளை | King's Street, Badulla.

| | | |
|---|---|---|
| ඔබේ අංකය / உமது இல. / Your No. | මගේ අංකය / எனது இல. / My No. 4/HRM/2/වා.ස්.මා/2018 | දිනය / திகதி / Date 2017.06. 30 |

"ඌව වෙල්ලස්ස නිදහස් අරගලයේ 200 වන අභිමානවත් සැමරුමට පෙළ ගැසෙමු"

ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්,

ඌව පළාතේ පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ ලේකම් වරුන්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

ඌව පළාත් සභාවේ සභා ලේකම්,

ඌව පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,

ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් හා

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් වෙත,

## <u>ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ අතර වාර්ෂික ස්ථාන මාරුවීම් - 2018 වර්ෂය</u>

ඌව පළාත් සභාවේ පළාත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයට අනුයුක්ත නිලධාරීන් සඳහා ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා 2017.06.29 දිනැතිව අනුමත කරන ලද ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව පහත සඳහන් සේවාවන්හි 2018 වර්ෂයට අදාළ වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

- සංවර්ධන නිලධාරී/ වැඩසටහන් සහකාර සේවය
- කළමනාකරණ සහකාර සේවය
- රියදුරු සේවය
- කාර්යාල කාර්ය සහායක සේවය

02. 2017.12.31 දිනට වසර 05ක් හෝ ඊට වඩා වැඩි සේවා කාලයක් එකම සේවා ස්ථානයක සේවය කළ නිලධාරීන් හා සේවා ස්ථානයක වසර 02ට වඩා වැඩි වසර 05 ට වඩා අඩු සේවා කාලයක් ඇති ස්ථාන මාරු අපේක්ෂා කරන නිලධාරීන්ට 2018 වර්ෂයට අදාළ වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමට උපදෙස් දිය යුතුවේ.ඒ අනුව මෙ සමග එවා ඇති ඇමුණුම 01 හි ස්ථාන මාරු ලබා දීමේදි සලකා බලනු ලබන පොදු කොන්දේසි ප්‍රකාරව ආකෘති පත්‍ර 02 හා 03ට අනුව ස්ථාන මාරු අයදුම්පත්‍ර ලබාගෙන, ආකෘති පත්‍ර 04 හා 05 ට ඇතුලත් කර, ආකෘති පත්‍ර 01 දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිවැරදිව උපලේඛන ගත කර 2017 ජූණි මස වැටුප් වාර්ථාවේ සහතික කල පිටපතක්ද සමගින් එක් එක් සේවාවන් සඳහා අදාල වන තොරතුරු වාර්ථාව වෙන වෙනම ගොණු කර 2017.07.31 දිනට පෙර මා වෙත යොමු කිරීමට ඔබ පෞද්ගලිකවම වග බලා ගන්නා ලෙසද කාරුණිකව දන්වමි.

03. අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර නැවත හරවා එවීමට කටයුතු කරනු ලබන අතර, නියමිත පරිදි සම්පූර්ණ නොවූ අයදුම්පත් සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 6:10 වගන්තිය අනුව කටයුතු කරනු ලබන බව දැනුම් දෙමි. එබැවින් අයදුම්පත් යොමු කරනු ලබන නිලධාරීන් වෙත ඒ පිළිබඳ උපදෙස් දෙන්නේ නම් මැනවි.

06. ඉහත ස්ථාන මාරු අයදුම්පත <u>www.uvadcspt.lk</u> යන වෙබ් ලිපිනයෙන්ද බාගත කරගත (Download) හැකි බව වැඩිදුරටත් දන්වමි.

ගාමිණී රාජකරුණා
ඌව පළාතේ ප්‍රධාන ලේකම්


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary - 055-2222809
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) / பிரதி பிரதான செயலாளர் (ஆளணி மற்றும் பயிற்சி) / Deputy Chief Secretary (Personnel & Training) - 055-2228626
ෆැක්ස් / தொலைநகல் / Fax - 055-2228700
සහකාර ප්‍රධාන ලේකම් / உதவி பிரதான செயலாளர் / Asst. Chief Secretary - 055-2229425
පරිපාලන නිලධාරී / நிருவாக உத்தியோகத்தர் / Administrative Officer - 055-2228627
පොදු දුරකථන අංක / பொது தொலைபேசி இல. / General Telephone Nos. - 055-2222804, 2222810, 055-2222712
වෙබ් ලිපිනය / வலைத்தளம் / Web Site - www.uvadcspt.lk
විද්‍යුත් තැපැල් ලිපිනය / மின்னஞ்சல் / E-Mail Address - upcdcspt@gmail.com